Article 11

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2018 - 02 - 21 |

පැමිණිලිකරු : කේ.ඩී. තිලන්ත දේශප්‍රිය මයා,
බෝගහවෙල,
ඌරගස්මංහන්දිය.

වගඋත්තරකරුවන් : 01 උ.පො.ප. ප්‍රසාද් සිරිවර්ධන මයා,
පොලිස් ස්ථානය,
ඌරගස්මංහන්දිය.

02 පො.කො. 88199 එරංග මයා,
පොලිස් ස්ථානය,
ඌරගස්මන්හන්දිය.

<u>පැමිණිලි අංකය : **HRC/2305/15**</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සදහන් කර ඇත්තේ, තමා ඇගලුම් කම්හලක සේවය කිරීමෙන් අනතුරුව නිවසට පැමිණ අමතර ආදායමක් වශයෙන් ත්‍රීවිල් රථයක් ධාවනය කරනු ලබන බවත්, ඒ අනුව 2012-05-11 වන දින ඌරගස්මංහන්දිය නගරයේ ත්‍රී වීල් රථ ගාලේ රැදී සිටි අතර, එදින රාත්‍රී 10.15 ට පමණ ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානයේ උප පොලිස් පරීක්ෂක ප්‍රසාද් සිරිවර්ධන නමැති නිලධාරියා තමා දෙසට පැමිණ "තෝ බීල නේද ඉන්නෙ" කියා කණට පහරදුන් බවත්ය. අනතුරුව පපුවට සහ ඔළුව පහත් කොට කොන්ද දෙසට පහරක් ගසමින් පරුෂ වචනයෙන් බැණ වැදීම් සිදු කල බවත් දක්වා ඇත. මෙම පහරදීම හේතු කොට ගෙන ඇල්පිටිය රෝහල වෙත 2012-05-11 වන දින රාත්‍රියේම ඇතුලත් වීමෙන් පසුව කරාපිටිය රෝහල වෙත 2012-05-12 වන දින ඇතුලත්ව 2012-05-18 වන දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලබා ගත් බවද සදහන් කර ඇත.




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94 -11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

තවදුරටත් පෙත්සම්කරු කොමිෂන් සභා පරීක්ෂණ අවස්ථාවේදී සඳහන් කර ඇත්තේ, මෙම නිලධාරියා විසින් පහර දුන් නමුත් අත්අඩංගුවට නොගත් බවය. මේ අනුව එදින රාත්‍රියේම නිවසට ගිය බවත්, ඇතිවූ සිද්ධිය සම්බන්ධයෙන් තම මවට ප්‍රකාශ කල බවත්, ඉන් අනතුරුව තම සහෝදරයා පැමිණීමෙන් පසු රාත්‍රී 10.40 ට පමණ ඌරගස්මංහන්දිය මූලික රෝහලට ගිය බවත්, එමගින් ලද උපදෙස් අනුව ඇල්පිටිය දිසා රෝහල වෙත රැගෙන ගිය බවත් දක්වා ඇත. මෙම රෝහලේ 2012-05-11 වන දින නේවාසිකව ප්‍රතිකාර ලැබීමෙන් පසු 2012-05-12 වන දින කරාපිටිය ශික්ෂණ රෝහල වෙත මාරු කල බවද දක්වා ඇත.

පෙත්සම්කරුගේ ලිඛිත පැමිණිල්ලට අනුව ඌරගස්මංහන්දිය පොලිස් ස්ථානාධිපතිගෙන් අදාල උද්‍යත හා අධිකරණ වෛද්‍ය වාර්තාවත් කැඳවා ඇති අතර, අධිකරණ වෛද්‍ය වාර්තාව ලබා ගැනීමට කරුණු ප්‍රමාණවත් නොවූ හෙයින් 2012-09-20 වන දින පෙත්සම්කරු වෙත අදාල තොරතුරු ලබාදීමට උපදෙස් දී ඇත.

වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම :-

පෙත්සමේ සඳහන් කර ඇති පරිදි අදාල තැනැත්තාට පහරදීම සම්බන්ධයෙන් වගඋත්තරකාර උප පොලිස් පරීක්ෂක ප්‍රසාද් මහතාගෙන් කරුණු විමසීමේදී 2012-05-11 වන දින ඌරගස්මංහන්දියේ තොරණ තිබූ බවත්, එහි රාජකාරි සඳහා පොලිස් කොස්තාපල් 38199 එරංග නිලධාරි සමග තමා යොදවා තිබූ බවත් මෙම රාජකාරියේ නිරතව සිටියදී පෙත්සම්කරුගේ ත්‍රීවිල් රථය තුළ වෙනත් අපරාධයකට සම්බන්ධ වූ පුද්ගලයෙකු සිටින බවට තමා වෙත පුද්ගලික තොරතුරක් ලද බවත්, ඒ අනුව එරංග නිලධාරිගේ යතුරු පැදියෙන් රාත්‍රී 10.20 ට පමණ අදාල ස්ථානය විමර්ශනය කල බවත් දක්වා ඇත. ඒ අවස්ථාවේදී මෙම පෙත්සම්කරුගේ ත්‍රීවිල් රථය තුළ දෙදෙනෙකු සිටි අතර, අදාල ස්ථානයට ළඟා වනවාත් සමගම ඔවුන් දෙදෙනා පලා ගිය බවත්, තමාගේ සහායට සිටි එරංග නිලධාරි පසුපස දිව ගිය නමුත් ඔවුන් අත්අඩංගුවට ගැනීමට නොහැකි වූ බවත් දක්වා ඇත. උ.පො.ප. ප්‍රසාද් මහතා පෙත්සම්කරුගෙන් ත්‍රී විල් රථය තුළ සිටි පුද්ගලයන් සම්බන්ධව කරුණු විමසූ නමුත් නොහඳුනන බව සඳහන් කල අතර, හයර් එකක් යාම සඳහා පැමිණ සිටි අය බවට ප්‍රකාශ කල බවද සඳහන් කර ඇත.

තවදුරටත් වගඋත්තරකරු විසින් සඳහන් කර ඇත්තේ, තමා මෙම ස්ථානයට ළඟා වීමට මොහොතකට පෙර ත්‍රීවිල් රථ ගාලේ යම් ආරවුල් තත්වයක් හට ගත් බවට දැන ගන්නට ලැබුණු බවයි.

පෙත්සම්කරුට සිදුවූ යැයි කියන අගතිය සම්බන්ව ඇල්පිටිය පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් කර ඇති අතර, ඇල්පිටිය සහකාර පොලිස් අධිකාරී වෙතින් ස්ථානාධිපති ඌරගස්මංහන්දිය වෙත ලද

උපදෙස් අනුව අදාල සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කළ බවට දන්වා ඇත. ඒ අනුව ත්‍රීවිල් රථ ගාල අසල පන්සලේ ස්වාමීන් වහන්සේගෙන් හා ත්‍රීවිල් රථ ගාලේ සිටි කිහිප දෙනෙකුගේ කටඋත්තර ලබා ගත් බවට දක්වා ඇති අතර, ලබාගත් තොරතුරු සටහන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. මෙම කරුණු පදනම් කරගෙන පොලිස් ස්ථානය සිදු කරන ලද විමර්ශනයන් සම්බන්ධයෙන් මෙම පෙත්සම්කරු පොලිස් ස්ථානයට කැඳවා නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව කරුණු විමසා ඇත. එහිදී වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ සියලු පරීක්ෂණ කටයුතු ස්ථානාධිපතිතුමා විසින් සිදු කළ බවත්, එකී වකවානුව තුළ මෙම පෙත්සම්කරු රෝහල් ගතව සිටි බවත් ය. එමෙන්ම පෙත්සම්කරු ප්‍රකාශ කරන පරිදි තමා අතින් හෝ තමා සමග රාජකාරි කරනු ලැබූ නිලධාරීන් විසින් කිසිදු පහරදීමක් සිදු නොකළ බවද දන්වා ඇත.

වගඋත්තරකරු වැඩිමනත් ලෙස කොමිෂන් සභා පරීක්ෂණ අවස්ථාවේදී සඳහන් කර ඇත්තේ, මෙම පෙත්සම්කරුගේ සහෝදරයෙකු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඔහු විසින් ත්‍රීවිල් රථ ගාලේ සේවය කරන ජයන්ත ජයරත්න නමැත්තාට ප්‍රසාද් මහතා පහර දෙනු දුටු බවට ප්‍රකාශයක් ලබා දෙන ලෙසට බල කිරීම් කර ඇති බවත්ය. ඒ අනුව 2012.05.11 වන දින සුළු පැමිණිලි ලේඛනයේ 10/118 ඡේදය යටතේ ප්‍රකාශ ලබා ගත් බවද දක්වා ඇත.

උ.පො.ප. ප්‍රසාද් මහතා සමග පොලිස් කොස්තාපල් 88199 තුසිත එරංග නිලධාරී සහභාගී වූ බව ප්‍රසාද් මහතා විසින් ප්‍රකාශ කර ඇති හෙයින් අදාල නිලධාරීගෙන් ප්‍රකාශ ලබා ගැනීමක් සිදු කර ඇත. මෙහිදී පො.කො. 88199 එරංග නිලධාරී විසින් සඳහන් කර ඇත්තේ, 2012-05-11 වන දින උ.පො.ප. ප්‍රසාද් මහතා සමග වැටලීම් රාජකාරියේ යෙදී සිටි බවත්, එසේ සිටියදී රාත්‍රී 8.30 ට පමණ ලද තොරතුරක් අනුව උතුරු මාගල ප්‍රදේශයට ගිය බවත්ය. ලැබුණු තොරතුරු අනුව ගංජා අලෙවි කරන පුද්ගලයෙක් අත්අඩංගුවට ගැනීම සඳහා ගිය බවත්, ඒ අනුව රාත්‍රී 10.00 පමණ වනතුරු අදාල ස්ථානයේ රැඳී සිටි නමුදු තොරතුරු වලට අනුව කිසිවක් අනාවරනය නොවුනු බවත්ය. එබැවින් නැවත ඌරගස්මංහන්දිය දෙසට පැමිණීමේදී ප්‍රසාද් මහතා හඳුනන පුද්ගලයෙකු තමන් පැමිණි යතුරු පැදිය නතර කරනවාත් එක්කම ඒ අසල ත්‍රීරෝද රථයක නැගී සිටි පුද්ගලයන් කිහිප දෙනෙකු පරුෂ වචන කියමින් සිටි බවත්, මේ අනුව යතුරු පැදිය නතර කළ බවත්, ත්‍රීරෝද රථයේ සිටි පුද්ගලයන් දෙදෙනා පොලිස් විමර්ශන සඳහා අවශ්‍යව තිබූ තැනැත්තන් බව ප්‍රසාද් මහතා දන්වා සිටි බවත්, ඒ අනුව ඒ දෙසට යනවාත් සමගම ත්‍රීරෝද රථය පන ගන්වා පිටත්ව ගිය බවත් දක්වා ඇත. ඒ අනුව ප්‍රසාද් මහතා ත්‍රීරෝද රථය පසුපස හඹා ගොස් පාර හරස් කොට නතර කර ගැනීමට හැකිවූ බවත් අනතුරුව පන්සලේ හාමුදුරුවන් දෙදෙනෙකු එම ස්ථානයට පැමිණි අතර ත්‍රීරෝද රථයේ සිටි පුද්ගලයන් දෙදෙනා පැන ගිය බවත්, රථයේ රියදුරු පමණක් ඉතිරි වූ බවත් සඳහන් කර ඇත. තුසිත එරංග නිලධාරී තවදුරටත් ප්‍රකාශ කර ඇත්තේ තමා පැන ගිය පුද්ගලයන් පසුපස ලුහු බැඳි නමුත් තම භාරයට ගැනීමට නොහැකි වූ බවය. මෙම අවස්ථාවේදී

ප්‍රසාද් මහතා විසින් ත්‍රීවිල් රියදුරුට ගංජා කාරයෝ කුඩු කාරයෝ රථයට නංවා නොගන්නා බවට උපදෙස් ලබා දීමක් සිදු කල අතර, පහරදීමක් සිදු නොවූ බවද සඳහන් කරඇත.

බෝධිමළුව විහාරයේ විහාරාධිපති හීපන්කන්දේ සරණංකර නාහිමි විසින් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ 2012-05-11 වන දින බෝධිමළුව විහාරයේ වැඩ වාසය කල බවත්, එදින රාත්‍රී 10.30 ට පමණ නිදා ගැනීමට සූදානම් වූ අවස්ථාවේ අසභ්‍ය වචනයෙන් කෑ ගැසීමක් ඇසුනු බවත්, ඒ සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා එළියට පැමිණි විට පන්සල සහ බස් නැවතුම්පල ඉදිරිපිට ප්‍රධාන පාරේ කොළ පැහැති ත්‍රීරෝද රථයක් නවතා තිබූ අතර, රථය තුළ ශබ්දයක් පිටවන බවට අවබෝධ වූ බවත්ය. රථය අසලට ගිය අවස්ථාවේදී පුද්ගලයන් තිදෙනෙකු හෝ හතර දෙනෙකු පොර බැදීමක් සිදුවූ බව වීදි ලාම්පු ආලෝකයෙන් දුටු බවද අනතුරුව පුද්ගලයන් දෙදෙනෙකු බස් නැවතුම්පොල දෙසට දිව ගිය අතර. රථය තුළ රියදුරු වන බණ්ඩාර යන තැනැත්තා සහ තවත් දෙදෙනෙකු ඒ වනවිටත් අසභ්‍ය වචනයෙන් කෑ ගසමින් රණ්ඩු කරමින් සිටි බවද සඳහන් කර ඇත. මේ අවස්ථාවේදී තමන් වහන්සේ පිරිස විසුරුවා හැරීමට උත්සාහ කල බවද සඳහන් කර ඇත.

අනතුරුව ත්‍රීරෝද රථය පිටත්ව යනවාත් සමගම අලුත්ගම දෙස සිට ඌරගස්මන්හන්දිය පොලිස් ස්ථානයේ දෙවෙනි මහත්මයා වන ප්‍රසාද් මහතා සහ තවත් නිලධාරි මහතෙකු යතුරු පැදියකින් පැමිණි අතර. අධික වේගයෙන් පිටත්වූ ත්‍රීරෝද රථය පොලීසිය ඉදිරිපිට පාරේදී දෙවෙනි මහත්මයා විසින් නතර කල බවත්. ස්වාමීන් වහන්සේද එම ස්ථානයට ළගා වූ බවත්, මේ අවස්ථාවේදී රථය තුළ සිටි තවත් දෙදෙනෙකු දිව ගිය බවත් ප්‍රකාශ කර ඇත. ත්‍රීරෝද රථය පැදවූ බණ්ඩාර යන අයගෙන් ප්‍රසාද් මහතා විසින් නම ඇසූ අතර රියදුරුට රණ්ඩු සරුවල් කර නොගන්නා ලෙස පවසමින් අවවාද කිරීමෙන් පසු ත්‍රීරෝද රථය අම්බලන්ගොඩ දෙසටත් දෙවෙනි මහත්තයා යටදොල පන්සලේ තොරණ ලගට යන බව පවසමින් ඇල්පිටිය දෙසටත් පිටත්ව ගිය බවද සඳහන් කර ඇත.

තවදුරටත් දිවුරුම් ප්‍රකාශයෙන් සඳහන් කර ඇත්තේ 2012-05-11 වන දින බණ්ඩාර සහ තවත් කිහිප දෙනෙකු බීමතින් ආරවුල් කරමින් සිටි බවත්, එම අවස්ථාවේදී අහඹු ලෙස එතනට පැමිණි ප්‍රසාද් මහතා බණ්ඩාර නමැති අයට කිසිදු පහරදීමක් සිදු නොකල බවත්ය.

තවද උ.පො.ප. ප්‍රසාද් නිලධාරි සමග විමර්ශනයට සහභාගි වූ යැයි පවසන පො.කො. 88199 කාරියවසම් හෙට්ටි ගමගේ තුසිත එරංග නිලධාරියාගෙන් කොමිෂන් සභාව විසින් ප්‍රකාශ ලබාගෙන ඇත. එම ප්‍රකාශයට අනුව ප්‍රසාද් මහතා වෙත ගංජා අලෙවි කරන පුද්ගලයෙක් තරප්පුව 8 කණුව යන ප්‍රදේශයේ සිටින බවට ලද තොරතුරකට අනුව අදාල ස්ථානයට නිලධාරීන් දෙදෙනාම ගිය බවත් වසා දමා ඇති පලතුරු කඩයක් අසල දකුණු පසට වන්නට පාර අයිනේ යතුරු පැදිය නතර කොට අදාල පුද්ගලයා පැමිණෙන තුරු රාත්‍රී 10.00 වන තෙක් ස්ථානයේ රැදී සිටි බවත්, එම තොරතුරට

අදාලව කිසිදු කරුණක් අනාවරණය නොවුනු හෙයින් නැවත උෘරගස්මංහන්දිය දෙසට පැමිණි බවත් දක්වා ඇත. මෙම අවස්ථාවේදී ප්‍රසාද් මහතා හඳුනන පුද්ගලයෙකු තම යතුරු පැදිය නතර කරනවාත් සමගම ත්‍රිරෝද රථයක නැගී පුද්ගලයින් කිහිප දෙනෙකු පරුෂ වචන කියමින් සිටි බවත්, ත්‍රිරෝද රථය තුළ පොලිස් විමර්ශන සඳහා අවශ්‍යව තිබූ පුද්ගලයන් දෙදෙනෙකු සිටි අතර තමා රථයට ලගාවෙනවාත් සමගම ත්‍රිරෝද රථය පිටත්ව ගිය බවත් සඳහන් කර ඇත. එකෙනෙහිම ප්‍රසාද් මහතාට ත්‍රිරෝද රථයේ පසුපස හඹා ගොස් රථය නතර කර ගැනීමට හැකිවූ බවද මෙම ස්ථානයට පන්සලේ හාමුදුරුවන් දෙදෙනෙකු ද පැමිණි අතර ඒ වන විට ත්‍රිරෝද රථයේ රියදුරු පමණක් ඉතිරිව සිටි බවද සඳහන් කර ඇත. පැන ගිය පුද්ගලයන් සම්බන්ධයෙන් සොයා බැලූ නමුත් ඔවුන් අල්ලා ගැනීමට නොහැකි වූ බවද දන්වා ඇත. තවදුරටත් මෙම වගඋත්තරකරු සඳහන් කර ඇත්තේ පැන ගිය පුද්ගලයන් දෙදෙනා මේ වනතෙක් කවුරුන්ද යන්න නොදන්නා බවය. පසුව ත්‍රිවිල් රියදුරුට ප්‍රසාද් මහතා විසින් කුඩු කාරයෝ ගංජා කාරයෝ ත්‍රිවිල් රථයේ දාගන්න එපා යනුවෙන් උපදෙස් දුන් බවත්, පහරදීමක් සිදු නොවූ බවත් සඳහන් කර ඇත.

විමර්ශනයේදී අනාවරණය වූ තොරතුරු මත කරාපිටිය ශික්ෂණ රෝහල මගින් අධිකරණ වෛද්‍ය වාර්තාව කැඳවීම් කර ඇති අතර. අදාල වෛද්‍ය වාර්තාවේ කෙටි ඉතිහාසයට අනුව.

- 2012-05-11 වන දින රාත්‍රී 10.15 ට පමණ පෙත්සම්කරු ත්‍රිවිල් රථ ගාලේ ත්‍රිවිල් රථය තුළ සිටි බවත්, පොලිස් පරීක්ෂක ප්‍රසාද් පැමිණ "බීලා නේද ඉන්නේ" කියමින් බැහැපන් කියා අතින් ඇද වම් කණට පහර දුන් බවත් දක්වා ඇත. පැමිණිලිකරු බීමත්ව නොමැති බව දන්වමින් පොලීසියට යන බව පැමිණිලිකරු දැන්වූ බවත්, එසේ ප්‍රකාශ කිරීමෙන් පසුව නිලධාරී සතුව තිබූ පිස්තෝලය රැගෙන " කුඩු වෙන්න තියනවා, මාස 6 කට කුඩු චෝදනා මත ඇතුලට දාන බවටත් පසුව පෙත්සම්කරු දෙකට නමා නිලධාරීගේ වැලමිටෙන් පිට ප්‍රදේශයට පහර දුන් බවය. ඒ වේදනාව මත නැගිට ගැනීමට අපහසු වූ බවත් දෙවරක් වමනය ගිය බවත් සඳහන් කර ඇත. තවදුරටත් පෙත්සම්කරුගේ වම් කණ නොඇසෙන බවට ප්‍රකාශ කල බවත් - දක්වා ඇත.

ඒ අනුව වෛද්‍ය නිලධාරී විසින් අදාල පෙත්සම්කරු (රෝගියා) ENT වෛද්‍යවරයෙක් වෙත යොමු කර ඇති බවද නිරීක්ෂණය වේ.

**වෛද්‍ය නිරීක්ෂණ අනුව පෙත්සම්කරුගේ වම් කණ ඇසීම ස්ථිර වශයෙන්ම අහිමිව ඇති බවට සටහන් කොට ඇත.**

**නිරීක්ෂණ :-**

මෙම පෙත්සම්කරු අත්අඩංගුවට ගැනීම උ.පො.ප. ප්‍රසාද් සිරිවර්ධන මහතාගේ ප්‍රමුඛත්වයෙන් සිදු කර ඇති අතර, පො.කො. 88199 එරංග නිලධාරී සහභාගි වූ බවට වගඋත්තරකාර පාර්ශවය

විසින් කරුණු දක්වා ඇත. නමුත් පෙත්සම්කරු දිගින් දිගටම සඳහන් කර ඇත්තේ, තමා ඉදිරියට උ.පො.ප. ප්‍රසාද් සිරිවර්ධන මහතා පමණක් පැමිණි බවත්, ඔහු විසින් තමාට පහරදීම් කළ බවත්ය.

වගඋත්තරකාර පාර්ශවයේ නිදහසට කරුණු තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ ප්‍රකාශයන් හා දිවුරුම් ප්‍රකාශයන් සැලකිල්ලට ගැනීමේදී හිපත්කන්දේ සරණංකර නාහිමි විසින් ත්‍රීවිල් රථයේ පිරිසක් සිටි බවට සඳහන් කර ඇති අතර, අවස්ථා දෙකකදී ඔවුන් පැන ගිය බවට සඳහන් කරනු ලැබ ඇත. එමෙන්ම ස්වාමීන් වහන්සේගේ ප්‍රකාශයට අනුව බීමත්ව සිටි පුද්ගලයන් විසුරුවා හැරීමට ප්‍රසාද් මහතා උත්සාහ කළ බවත් සඳහන් කරනු ලැබ ඇත. තවද ප්‍රසාද් මහතා සමග විමර්ශනයට සහභාගි වූවා යැයි සඳහන් කරන පො.කො. 88199 අංක දරණ පොලිස් නිලධාරීගේ රාජකාරිමය තත්වය සම්බන්ධයෙන් කිසිදු සටහනක් ඉදිරිපත්ව නොමැත.

පො.කො. 88199 එරංග මහතා විසින් කොමිෂන් සභාව ඉදිරියේ දෙනු ලබන ප්‍රකාශයට අනුව ගංජා අලෙවි කරන පුද්ගලයෙකු සම්බන්ධයෙන් තොරතුරක් ලද බවත්, ඒ අනුව අදාළ විමර්ශන කටයුතු වලට සම්බන්ධ වූ අතර, සැකකරුවන් තම ග්‍රහනයට ගැනීම සඳහා රාත්‍රී 10.00 පමණ තෙක් යම් ස්ථානයක රැඳී සිටි බවත්, එකී කාරණා ඉටු කර ගැනීමට නොහැකි වූ හෙයින් ඌරගස්මංහන්දිය දෙසට පැමිණීමේදී ප්‍රසාද් මහතා හඳුනන පුද්ගලයෙකු තම යතුරු පැදිය නතර කොට පොලීසියට අවශ්‍ය පුද්ගලයන් දෙදෙනෙකු මෙම ස්ථානයේ සිටි බව ප්‍රසාද් මහතා වෙත දන්වා සිටි බවත් සඳහන් කර ඇත. එම කරුණු අනුව පෙන්වා සිටි පරිදි එම ස්ථානයට ලගා වූ නමුත් ත්‍රීරෝද රථය පන ගන්වා පිටත්ව ගිය බවට දක්වා ඇත. එසේම මීටර් 10 ක පමණ ඈතින් ත්‍රීරෝද රථය නතර කර ගැනීමට හැකිවූ බවත් එකෙනෙහිම පන්සලේ හාමුදුරුවන් දෙදෙනෙකු පැමිණි බවත් සඳහන් කර ඇති අතර, රථය නතර කරනවාත් සමගම පුද්ගලයන් දෙදෙනා පැන ගිය බවද සඳහන් කර ඇත.

ඉහත ප්‍රකාශය සහ ස්වාමීන් වහන්සේ විසින් දෙනු ලබන දිවුරුම් ප්‍රකාශයන් සැලකිල්ලට ගැනීමේදී එකිනෙකට නොගැලපෙන කරුණු ඉදිරිපත්ව ඇති බව පැහැදිලිව නිරීක්ෂණය වේ. වගඋත්තරකාර පාර්ශවයෙන් ලබාදී ඇති උද්‍යත ගොනු අවධානයට යොමු කිරීමේදී 2012-05-11 වන දින පැය 20.30 ට උප පොලිස් පරීක්ෂක ප්‍රසාද් මහතා සමග පොලිස් කොස්තාපල් 88199 එරංග සිවිල් ඇඳුමින් පිටව ගිය බවට සටහන් වී ඇත. එමෙන්ම මෙම නිලධාරීන් ස්ථානාධිපතිගේ නියෝග පරිදි තොරතුරු කිහිපයක් පරීක්ෂා කිරීම සඳහා පිටව යන බවට සටහන් කර ඇති අතර පැමිණීමේ සටහන් අනුව ස්ථාන කිහිපයක් පරීක්ෂණයට භාජනය වී ඇති බවත් ඌරගස්මංහන්දියේ අසභ්‍ය වචන කියමින් බීමත් පුද්ගලයන් සිටි බවත්, ඔවුන් පැන ගිය බවත් ත්‍රීරෝද රථයේ සිටි රියදුරු වන බණ්ඩාර නමැත්තා තම යාළුවන් බීමත්ව සිටි බව දැන්වූ බවත් සටහන් කර ඇත. නමුත් ප්‍රසාද් මහතා කොමිෂන් සභාව වෙත ලබාදී ඇති ප්‍රකාශයන් අනුව ත්‍රීවිල් රථයේ සිටි පුද්ගලයන් රියදුරු විසින් නොහඳුනන බව සඳහන් කළ බවට දන්වා ඇත.

වගඋත්තරකාර පාර්ශවයෙන් දෙනු ලැබූ ප්‍රකාශයන්ට අනුව බීමත්ව පුද්ගලයන් කිහිප දෙනෙකු ත්‍රීවිල් රථය තුළ සිටි බවට දක්වා ඇති අතර, තවත් අවස්ථාවක සඳහන් කර ඇත්තේ පොලිස් විමර්ශනයන්ට අවශ්‍ය පුද්ගලයන් සිටි බවය. තවද උප පොලිස් පරික්ෂක ප්‍රසාද් මහතාගේ සටහන් වලට අනුව ත්‍රීවිල් රථය තුළ සිටි පුද්ගලයන් තම යහළුවන් බව පෙත්සම්කරු ප්‍රකාශ කළ බවත් සඳහන් කර ඇත. කරුණු මෙසේ තිබියදී මෙම පෙත්සම්කරු පොලිස් ස්ථානයට රැගෙන යාමකින් තොරව හා ප්‍රකාශ ලබා ගැනීමකින් තොරව නිලධාරීන්ගේ රාජකාරිය නිසි අයුරින් සිදු කර නොමැති බවක් නිරීක්ෂණය වේ.

අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු සැලකිල්ලට ගැනීමේදී රෝගියාගේ ඉතිහාසයට අනුව - 2012-05-11 වන දින රාත්‍රී 10.15 ට පමණ පෙත්සම්කරු ත්‍රීවිල් රථ ගාලේ සිටින අවස්ථාවේදී උප පොලිස් පරීක්ෂක ප්‍රසාද් මහතා යතුරු පැදියෙන් පැමිණ " බැහැපන් " කියා අතින් ඇද වම් කණට කිහිප වාරයක් පහර දුන් බවත් පහර දීමේදී හේතුව කුමක්ද යන්න විමසූ නමුත් හේතුවක් අවශ්‍ය නැහැ කියා ප්‍රසාද් මහතා ප්‍රකාශ කළ බවත්, බීමත්ව සිටින්නේද යන්න තමාගෙන් විමසූ බවත් සඳහන් කර ඇත. පහරදීමෙන් පසු පොලීසි යන බවට පෙත්සම්කරු ප්‍රකාශ කිරීමේදී පිස්තෝලය රැගෙන "කුඩු වෙන්න තියනවා, කුඩු දාලා මාස 6 කට ඇතුලට දමන බවත්" පසුව දෙකට නවා පිට දෙසට වැලමිටෙන් පහර දුන් අතර, ඒ අවස්ථාවේදී පෙත්සම්කරුට නැගිටීමට පවා අපහසු වූ බවත්, දෙවරක් වමනය ගිය බවත් ප්‍රකාශ කර ඇත. තවදුරටත් ඔහු විසින් සඳහන් කර ඇත්තේ වම කණ සම්පූර්ණයෙන්ම නො ඇසෙන බවය. -

වෛද්‍ය නිරීක්ෂණයන්ට අනුව තුවාල කිසිවක් නොමැති බව සටහන් කර ඇති අතර, පෙත්සම්කරු (වින්දිතයා) උගුර කණ නාසය සම්බන්ධව ශල්‍ය වෛද්‍යවරයෙක් වෙත යොමු කර ඇති බව නිරීක්ෂණය වේ. අනතුරුව අධිකරණ වෛද්‍ය නිලධාරිණී ජානකී වරුසාහෙන්දික් මහත්මිය විසින් සිදු කරනු ලබන නිරීක්ෂණයන්ට අනුව මෙම පෙත්සම්කරුගේ (වින්දිතයා) වම් කණ ස්ථිර වශයෙන්ම නොඇසෙන බවට තහවුරු කර ඇත. එමෙන්ම පෙත්සම්කරු විසින් දෙනු ලබන ප්‍රකාශයන් වලට සමානාත්මතාවයක් ඇති බවට අධිකරණ වෛද්‍ය නිලධාරීතුමිය විසින් සටහන් කරනු ලැබ ඇත.

**නිගමනය :-**

අදාළ පෙත්සම්කරුගේ පැමිණිල්ලට අනුව කොමිෂන් සභා විමර්ශන කටයුතු සිදු කරනු ලැබූ අවස්ථාවේදී ඔහු විසින් සඳහන් කර ඇත්තේ, උ.පො.ප. ප්‍රසාද් සිරිවර්ධන මහතා පමණක් තමා අභියසට පැමිණ පහරදීම් සිදු කළ බවය. වගඋත්තරකාර පාර්ශවයේ උදෘතයන්ට අනුව ඔහු සමග පො.කො. 88199 එරංග නිලධාරී සිවිල් ඇඳුමෙන් පිටව ගොස් ඇති බවට පැහැදිලි විය. කෙසේ

නමුත් මෙම පෙත්සම්කරුට (වින්දිතයා) අමානුෂික අත්දමින් පහරදීමක් සිදුවී ඇති බවට ලබාදී ඇති අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව බෙහෙවින් පැහැදිලිව දක්නට ඇත.

එමෙන්ම වගඋත්තරකාර පාර්ශවයේ නිදහසට කරුණු තහවුරු කිරීම සම්බන්ධව ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශයන් වල කරුණු එකිනෙකට පරස්පර වන බවද නිරීක්ෂණය වී ඇත.

ඉහත කී සමස්ථ කරුණු අනුව 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට ආරක්ෂා කර දී ඇති කෲර අවමන් සහගත සැළකිල්ලකට භාජනය නොවීමේ මූලික අයිතිවාසිකම පැමිණිලිකරු සම්බන්ධයෙන් උල්ලංඝනය වී ඇති බවට පරීක්ෂණයෙන් අනතුරුව තීරණය කරනු ලැබේ.

**නිර්දේශය :-**

1 පලවන වගඋත්තරකාර උ.පො.ප ප්‍රසාද් සිරිවර්ධන යන අය විසින් පැමිණිලිකරුට රු. 25,000/- ක මුදලක් ගෙවිය යුතුය.

2 මෙහි පිටපත් අවශ්‍ය ඉදිරි පියවර ගැනීම සඳහා පොලිස්පතිවරයා වෙතද යොමු කරනු ලැබේ.

2018-03 -20 වන දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම. නොවීම හෝ වර්තමාන තත්වය සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

B/R-4